# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,665—1959 පෙබරවාරි 13 වැනි සිකුරාද—13.2.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදි)**


# I වැනි කොටස: (I) වැනි ජෙදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

**බී. ටී. 62 වැනි අංක දරණ ආහාර මිළ නියෝගය.**

**අතිරේක ආහාර ද්‍රව්‍ය.**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

මඩකලපු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක වික්‍රමසිංහ පතිරන වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් සහ 3 (2) වගන්තිය සමඟ කියවමින් ආහාර මිළ පාලක තැන කෙරෙහි පැවරී තිබෙන බලතල අනුව—

(අ) 1958 අගෝස්තු මස 27 වෙනි දින අංක බී. ටී. 58 දරණ ආහාර පාලන නියෝගය ද 1958 සැප්තැම්බර් මස 2 වෙනි දින දරණ හා අංක 11,511 දරණ ලංකාණ්ඩුවේ විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද එහි සඳහන් උපලෙඛනවල උම්බලකඩ විකිණීමේ තොග ඉවෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(ආ) මීට යාකර ඇති උපලෙඛනයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දල බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පරිභොගියෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් ද උපලෙඛනයේ සඳහන් මඩකලපු දිස්ත්‍රික්කයේ ප්‍රදේශවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව ඊට වැඩි මිළට විකුණන්ට බැරි හැටියට මෙම නියෝගයෙන් නියම කරමි.

(ඉ) 1 හා 2 වෙනි උපලෙඛනවල සඳහන් සුදුරු පිළිබඳව 1958 අගෝස්තු මස 27 වෙනි දින අංක බී. ටී. 58 දරණ ආහාර පාලන නියෝගයද, 1958 සැප්තැම්බර් මස 2 වෙනි දින අංක 11,511 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතිරේක ද්‍රව්‍ය සම්බන්ධ 3 වෙනි සිට 8 වෙනි දක්වා ජෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගතවූ හැටියට සැලකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1959 පෙබරවාරි මස 6 වෙනි දින පස්වරු 3ට මඩකලපුවේ දී අත්සන් තබන ලදි.

ඩබ්ලිව්. පතිරන,
මඩකලපු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන.

### උපලේඛනය 1

**යට සඳහන් ප්‍රදේශවල තොග වෙළඳාමේ දල බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ**

| ද්‍රව්‍ය | කෝරලේ උතුරු, කෝරලේ මධ්‍යම හා කෝරලේ දකුණු ගම්සභා ප්‍රදේශ අතහැර මන්මුන උතුර, මන්මුන දකුණ–නැගෙනහිර සහ එරුවිල් පෝරතිවු, ඒරාවූර් කෝරලේ පත්තු යන ප්‍රාදේශිය ආදයම් පාලක නිලධාරින්ගේ කොට්ඨාශ | කෝරලේ පත්තුවේ කෝරලේ උතුරු, කෝරලේ මධ්‍යම හා කෝරලේ දකුණ | කරවාකු හා සම්මාන්තුර පත්තුවේ ප්‍රාදේශිය ආදයම් පාලක නිලධාරින්ගේ කොට්ඨාශ | අක්කරපත්තු බින්තැන්න හා වැවගම් පත්තුවේ ප්‍රාදේශිය ආදයම් පාලක නිලධාරින්ගේ කොට්ඨාශ | පානම පත්තුවේ ප්‍රාදේශිය ආදයම් පාලක නිලධාරිගේ කොට්ඨාශ |
|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ ... ... | 245 50 ... | 245 90 ... | 246 10 ... | 246 20 ... | 246 50 |

## උපලේඛනය 2

**යට සඳහන් ප්‍රදේශවල සිල්ලර වශයෙන් විකිණීමේදී රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ**

| ද්‍රව්‍ය | | මන්මුන උතුර-බස්නාහිර ගම්සභාව ප්‍රදේශ අත්හැර, මන්මුන උතුර ප්‍රාදේශීය ආදයම් පාලක නිලධාරිගේ කොට්ඨාශය | | මන්මුන උතුර-බස්නාහිර ගම්සභා ප්‍රදේශ තුළ, මන්මුන දකුණ-බස්නාහිර, එරුවිල් පෝරතිවු, කරවාකු, සම්මාන්තුර, අක්කරපත්තු පානම, ඒරාවූර් කෝරළ, බින්තැන්න සහ වැව්ගම්පත්තුවේ ප්‍රාදේශීය ආදයම් පාලක නිලධාරිගේ කොට්ඨාශය |
|---|---|---|---|---|
| | | රු. ශ. | | රු. ශ. |
| උම්බලකඩ ... | ... | 2 46 | ... | 2 47 |

---

**ඇම්. ඇන්/2 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය.**

අතිරේක ආහාර ද්‍රව්‍ය
(උම්බලකඩ)

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

#### නියෝගය

මන්නාරම් දිස්ත්‍රික්කයේ උප ආහාර මිළ පාලක තැන්පත් සන්මුගම් පරමනාදන් වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු අංක 4 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 සැප්තැම්බර් මස 15 වෙනි දින අංක 11,525 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 සැප්තැම්බර් මස 13 වෙනි දින අංක ඇම්. ඇන්/9 දරණ ආහාර මිළ නියෝගයේ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උප ලේඛනයේ 2 වැනි, 3 වැනි තීරවල පිළිවෙලින් දක්වෙන උම්බලකඩ, තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළද, මෙම නියෝගයෙන් අද දින සිට අවලංගු කරමි.

(2) තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර රාත්තලක්ද, මන්නාරම නගර සීමාව තුළ විකිණිය හැකි වැඩිම මිළ මේ උපලේඛනයේ 2 වැනි, 3 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මන්නාරම් නගරයේ නාගරික සීමාවන් තුළ උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මන්නාරම් නගරයේ නාගරික සීමාවන් තුළ යම් ස්ථානයක හෝ වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමීත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුට මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) එසේම මන්නාරම් නාගරික සීමාවන් තුළ උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම මිලයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(8) උම්බලකඩ විකුණන විට එය බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිලත් උපලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුලත් වී ඇති බවද නියම කරමි.

1959 පෙබරවාරි මස 11 වෙනි දින පස්වරු 3 ට මන්නාරම් කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඇස්. පරමනාදන්,
උප ආහාර මිල පාලක තැන.
මන්නාරම් දිස්ත්‍රික්කය.

#### උපලේඛනය

| 1 වෙනි තීරය | | | 2 වෙනි තීරය | | 3 වෙනි තීරය |
|---|---|---|---|---|---|
| විස්තරය | | | තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ | | සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ |
| | | | රු. ශ. | | රු. ශ. |
| උම්බලකඩ (සියලුම වර්ගවල) ... | ... | ... | 251 00 | ... | 2 51 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

නො. වී. 56 දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

වවුනියා දිස්ත්‍රික්කයේ උප ආහාර මිළ පාලක තැන්පත් පරරාජසේකරම් පිල්ලේ තම්බයියා වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පවරා තිබෙන බලතල අනුව මේ නියෝගයෙන්—

(1) 1958 අගෝස්තු මස 29 වෙනි දින අංක 11,508 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 අගෝස්තු 25 වෙනි දින වී. 50 දරණ ආහාර මිළ නියෝගයේ සඳහන් පරිදි 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සඳහා තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළද සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යා කර ඇති උපලෙඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩර යක්ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පරිභොගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් ද මීට යාකර ඇති උපලෙඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් සීමාවන් තුළ විකිණිය හැකි වැඩිම මිළ ගණන් මේ උපලෙඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් අද සිට නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්;

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්;

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිල අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම වවුනියා දිස්ත්‍රික්කයේ සීමාවන් තුළ උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නො විකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, වවුනියා දිස්ත්‍රික්කයේ සීමාවන් තුළ යම් ස්ථානයක හෝ වාහනයක උපලෙඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයේ කාර්ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තව්ද මෙම නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම පළමුවෙනි උපලෙඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින් ම හා පළමුවෙනි උපලෙඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින් ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(8) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් උපලෙඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වී ඇති බවද නියම කරමි.

පී. තම්බයියා,
වවුනියා දිස්ත්‍රික්කයේ උප ආහාර පාලක තැන.

1959 පෙබරවාරි මස 9 වෙනි දින පස්වරු 3ට වවුනියා කච්චේරියේ දී අත්සන් කරන ලදී.

### පළමුවැනි උපලෙඛනය

**වව්නියා දකුණු දෙමළ කොට්ඨාශය, ආසිකුලම්, වව්නියා, නොච්චිමෝදෙයි, නෙදුම්කුලම් සහ පුතුකුලම් සහ වව්නියා දකුණු සිංහල කොට්ඨාශය, මඩුකන්ද සහ ඊරච්පෙරියකුලම**

| 1 වැනි තීරය<br>විස්තරය | 2 වැනි තීරය<br>ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | 3 වැනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ සෑම වර්ගයක්ම ... ... ... ... ... | 248 10 | 2 50 |

### දෙවැනි උපලෙඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය<br>ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට දෙවැනි ලේඛනයේ සඳහන් ගණන් වලට පහත සඳහන් මිළ ගණන් එකතු විය යුතුයි | 3 වැනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට දෙවැනි ලේඛනයේ සඳහන් ගණන් වලට පහත සඳහන් මිළ ගණන් එකතු විය යුතුයි |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| 1. ආදයම් පාලක දිස්ත්‍රික්කය දෙමළ මරුදන්කුලම්, මරදමඩු, රාසේද්‍රකුලම්, ආදයම් පාලක සිංහල මරදමඩුව හැර සුදුවැන්දපුලවු සහ උළුක්කුලම ... ... ... | 0 25 ... | 0 01 |
| 2. ආදයම් පාලක දිස්ත්‍රික්කය දෙමළ පෙරියපුලියන්කුලම, වාකයිකුඩ්ඩිනා ඔළුක්කුලම, වාලෙයිවෙව තාල්කුලම සහ සිංහල ආදයම් පාලක දිස්ත්‍රික්කයේ උළුක්කුලම කොට්ඨාශයේ මරදමඩුව ... | 0 50 ... | 0 01 |

| 1 වැනි තීරය | 2 වැනි තීරය | | 3 වැනි තීරය |
|---|---|---|---|
| | ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට දෙවැනි ලේඛනයේ සඳහන් ගණන් වලට පහත සඳහන් මිළ ගණන් එකතු විය යුතුයි. | | ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළට දෙවැනි ලේඛනයේ සඳහන් ගණන්වලට පහත සඳහන් මිළ ගණන් එකතු විය යුතුයි. |
| | රු. ශ. | | රු. ශ. |
| 3. වවුනියා උතුරු ආදායම් පාලක දිස්ත්‍රික්කයේ නෙඩුන්කර්නි, මාන්කුලම්, ඔලුමඩු කනගරායන්කුලම් සහ පුලියන්කුලම් ... ... ... ... | 0 50 | ... | 0 01 |
| 4. වවුනියාවේ උතුරු ආදායම් පාලක දිස්ත්‍රික්කයේ පරන්තන්, මනවාලන් පඩ්ඩමුරිප්පු, තාන්ඩුවාන්, කච්චිලාමඩු, උන්වල්කඩ්ඩු ... ... ... ... | 0 75 | ... | 0 02 |
| 5. වවුනියාවේ මුහුදුබඩ ප්‍රදේශයේ ආදායම් පාලක දිස්ත්‍රික්කයේ මුල්ලියවලෙයි, තන්නියූත්තු, මුලතිවු, වෙල්ලෙයිමුල්ලිවයිකාල් ... ... ... ... | 1 0 | ... | 0 02 |
| 6. මුහුදුබඩ ප්‍රදේශයේ ආදායම් පාලක දිස්ත්‍රික්කයේ කුමුලමුනෙයි, පුදුකුඩියිරිප්පු අම්බලවන්-පොක්කනෙයි ... ... ... ... | 1 25 | ... | 0 02 |
| 7. මුහුදුබඩ ප්‍රදේශයේ ආදායම් පාලක දිස්ත්‍රික්කයේ කෝකුලායි සහ කොක්කුතොඩුවායි ... | 1 50 | ... | 0 03 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළවේ. එකී මිළට වැඩියෙන් නො විකිණිය යුතුයි.

---

**කේ. ඩී. 71 වෙනි අංක දරණ ආහාර මිල නියෝගය**

අතිරේක ආහාර ද්‍රව්‍යයෝ (උම්බලකඩ)

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ නියෝජ්‍ය ආහාර මිල පාලක තැන්පත් ඇලන් බැසිල් සැමුවෙල් නේසරාජා පුල්ලෙනායගම් වන මම, 1950 හේ අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි වගන්තියත් සමග කියවෙන 3 (2) වගන්තියෙන් මට පැවරි ඇති බලතල අනුව—

(1) අංක 11,350 සහ 1958 ජූනි 7 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද අංක කේ. ඩී. 65 සහ 1958 ජූනි 5 වෙනි දින දරණ ආහාර මිළ නියෝගයේ උම්බලකඩ වල තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිලද සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිලද නියමකර ඇති කොටස් මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) 1950හේ 29 වෙනි අංක දරණ මිල පාලන පනත අනුව සකස්වුණු, කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, විකිණිය හැකි වැඩිම තොග සහ සිල්ලර මිල ගණන් වලට මෙයට යාකළ උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරුවල සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ 1 වෙනි තීරුවේ පෙදෙස්වල උම්බලකඩ විකිණිය හැකි වැඩිම තොග මිල සහ සිල්ලර මිල ගණන් ගත යුතු බැව් මෙයින් වහාම නියෝග කරමි.

(3) තවද මේ නියෝගයේ කාර්‍යය සඳහා—

(අ) උම්බලකඩවල ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් බවත්,

(ආ) උම්බලකඩ පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හොණ්ඩරයකට වඩා අඩු ප්‍රමාණයක් විකුණනු ලබන්නේ නම් එය සිල්ලරට විකිණීමක් බවත්, මෙයින් නියෝග කරමි.

(4) එසේම උපලේඛනයේ සඳහන් සෑම පෙදෙසකම උම්බලකඩ තවත් දෙයක් සමග කවලන් කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බැව් නියෝග කරමි.

(5) එසේම උපලේඛනයේ සඳහන් පෙදෙස්වල යම් තැනෙක හෝ යම් වාහනයක උම්බලකඩ හිමිවීමක් හෝ පාලනයක් යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම උම්බලකඩවල මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල ගණන් ප්‍රදර්ශනය කෙරෙන නිවේදනයක් එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ හොඳින් පෙනෙන පරිදි තැබිය යුතු බැව් මෙයින් නියම කරමි.

(6) එසේම, උපලේඛනයේ සඳහන් පෙදෙස්වල උම්බලකඩ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ විකුණන සෑම කෙනෙකු විසින්ම මිලදී ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් දෑ ඇතුළු රිසිට් පතක් දියයුතු බව නියෝග කරමි :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යය විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල ;

(ඇ) වෙළඳාම කුමක්ද යන බව, තොග වශයෙන් ද සිල්ලර වශයෙන්ද යන බව.

(7) එසේම, මේ නියෝගයේ කාර්‍යය සඳහා රාත්තල යන්නෙන් සලකනු ලබන්නේ '' ඇවෝර්දුපොයි '' බර ක්‍රමය ගණන් ගත් රාත්තල බවද නියම කරමි.

(8) උම්බලකඩ යම්කිසි දෙයක ඔතනු ලැබේ නම, නැතහොත් බහාලනු ලැබේ නම් එහි මිලද මෙම මිල නියෝගයෙහි සඳහන් විකිණිය හැකි වැඩිම මිලට ඇතුලත්කොට තිබෙන බැව් නියම කරමි.

1959යේ පෙබරවාරි මස 10 වැනි දින පස්වරු 3.25 ට මහනුවරදී අත්සන් කරන ලදී.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශයේ
නියෝජ්‍ය ආහාර මිල පාලක.

## උපලේඛනය

| 1 වෙනි තීරුව<br>පෙදෙස | 2 වෙනි තීරුව<br>කොළඹ නාගරිකයේ ශුඩ බර හොණ්ඩරයකට අයකෙරිය යුතු වැඩිම තොග මිලට එකතු කළයුතු මුදල<br>රු. ශ. | 3 වෙනි තීරුව<br>කොළඹ නාගරිකයේ ශුඩ බර රාත්තලකට අය කෙරිය යුතු වැඩිම සිල්ලර මිලට එකතු කළ යුතු මුදල<br>රු. ශ. |
|---|---|---|
| (1) මහනුවර නාගරිකය, ගහවට කෝරලය සහ උඩුනුවර යටිනුවර ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... ... ... | 4 0 ... | 0 5 |
| (2) පාතහේවාහැට, පාතදුම්බර, හාරිස් පත්තුව, තුම්පනේ සහ උඩපලාත ප්‍රාදේශීය ආදයම් නිලධාරීන්ගේ කොට්ඨාශ ... ... ... ... ... | 4 20 ... | 0 5 |
| (3) (අ) උඩදුම්බර හා උඩබුලත්ගම ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය<br>(ආ) නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශය | 4 50 ... | 0 5 |

**සැලකිය යුතුයි.**—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිල නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිල ගණන්ය. මේ මිල ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

**කේ. ඩී. 68 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය** **කරවල සහ වියළි ඉස්සන්**

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

#### නියෝගය

මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ නියෝජ්‍ය ආහාර මිල පාලක තැන්පත් ඇලන් බැසිල් සැමුවෙල් නේසරාජා පුල්ලෙනායගම් වන මම, 1950හේ අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි වගන්තියත් සමග කියවෙන 3 (2) වගන්තියෙන් මට පැවරී ඇති බලතල අනුව—

(1) අංක 11,367 සහ 1958 ජූනි 21 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක කේ. ඩී 66 සහ 1958 ජූනි 18 වෙනි දින දරණ ආහාර මිල නියෝගය අද සිට මෙම නියෝගයන් අවලංගු කරමි.

(2) 1950 හේ 29 වෙනි අංකය දරණ මිල පාලන පනත අනුව සකස්වුණු, කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, විකිණිය හැකි වැඩිම තොග සහ සිල්ලර මිල ගණන්වලට මෙයට යාකළ 2 වෙනි උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරුවල සඳහන් මිල ගණන් එකතු කිරීමෙන් 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරුවේ සඳහන් පෙදෙස්වල, 1 වෙනි උපලේඛනයේ සඳහන් කරවල හෝ වියළි ඉස්සන් වර්ග විකිණිය හැකි වැඩිම තොග සහ සිල්ලර මිල ගණන්, ගණන් ගත යුතු බැව් මෙයින් වහාම නියෝග කරමි.

(3) තවද, මෙම නියෝගයෙහි කාය්‍යීය සඳහා—

(අ) මීට යාකොට ඇති 1 වෙනි උපලේඛනයේ සඳහන් කරවල හෝ වියළි ඉස්සන් වර්ග වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් බවත්,

(ආ) යථෝක්ත උපලේඛනයේ සඳහන් කරවල හෝ වියලි ඉස්සන් වර්ග කෑම පිණිස හෝ පාවිච්චිය පිණිස ශුද්ධ බර හොණ්ඩරයකට වඩා අඩු ප්‍රමාණයක් විකුණනු ලබන්නේ නම් එය සිල්ලර විකිණීමක් බවත්,

මෙයින් නියෝග කරමි.

(4) එසේම 2 වෙනි උපලේඛනයේ සඳහන් සෑම පෙදෙසකම 1 වෙනි උපලේඛනයේ සඳහන් කරවල හෝ වියලි ඉස්සන් වර්ග කවත් දෙයක් සමග කලවම් කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බැව් නියෝග කරමි.

(5) එසේම දෙවෙනි උපලේඛනයෙහි සඳහන් පෙදෙස්වල, යම් තැනෙක හෝ යම් වාහනයක 1 වෙනි උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයක්, හිමිවීමක් හෝ පාලනයක් යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එකී ද්‍රව්‍යය ගැන මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල ගණන් දක්වන නිවේදනයක් එකී ස්ථානයේ හෝ වාහනයේ හොඳින් පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර තැබිය යුතු බැව් නියම කරමි.

(6) එසේම, 2වෙනි උපලේඛනයේ සඳහන් පෙදෙස්වල 1 වෙනි උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ විකුණන සෑම කෙනෙකු විසින්ම, මිල දී ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් දෑ ඇතුළු රිසිට් පතක් දිය යුතු බැව් නියෝග කරමි:—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යය විකුණූ ප්‍රමාණය (බරින්) ;

(ඉ) විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල ; සහ

(ඊ) වෙළෙඳම කුමක්ද යන බව (තොග වශයෙන්ද නැතහොත් සිල්ලර වශයෙන්ද යන බව.

(7) එසේම, මෙම නියෝගයේ කාය්‍යී සඳහා රාත්තල යන්නෙන් සලකනු ලබන්නේ '' ඇවර්දුපොයි '' බර ක්‍රමය අනුව සම්මත රාත්තල බවද නියම කරමි.

(8) 1 වෙනි උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයක් විකුණනු ලබන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍යය යම් කිසි දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහා ලනු ලැබේනම් එහි මිලද මෙම මිල නියෝගයේ සඳහන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් වලට ඇතුලත් කොට තිබෙන බැව් නියම කරමි.

(9) තවද; කුම්බලා, බොම්බිලි, හාල්මැස්සන් සහ වියළි ඉස්සන් හැර 1 වෙනි උපලේඛනයේ සඳහන් වෙනත් කරවල කිසිවක බහා විකුණන විට එම කරවල බහා ඇති එක එක භාණ්ඩය සඳහා දල බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් දහය බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිල ගණන් ගත යුතු බවද,

(10) 1 වෙනි උපලේඛනයේ සඳහන් කුම්බලාවුන් කිසිවක බහා විකුණන විට, ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා දල බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් විසිපහ බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිල ගණන් ගත යුතු බවද,

(11) 1 වෙනි උපලේඛනයේ සඳහන් බොම්බිලි කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා, දල බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් අට බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිල ගණන් ගත යුතු බවද,

(12) 1 වෙනි උපලේඛනයේ සඳහන් හාල්මැස්සන් කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා, දල බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් විස්ස බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගත යුතු බවද,

(13) 1 වෙනි උපලේඛනයේ සඳහන් වියළි ඉස්සන් ලෙලි රහිතව හෝ සහිතව කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා, දල බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් පහළොහ බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිල ගණන් ගත යුතු බවද,

(14) මෙම නියෝගය සඳහා "ශුද්ධ" යන්නන් හැඟවෙන්නේ දල බරින් තාර බර අඩුකොට ඉතිරි වන බර හෝ කරවල නැතහොත් වියළි ඉස්සන් ගේ පමණක් බර බවද නියම කරමි.

1959 යේ පෙබරවාරි මස 9 වෙනි දින පස්වරු 2.40 ට මහනුවරදී අත්සන්කරන ලදී.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට කොට්ඨාශයේ
නියෝජ්‍ය ආහාර මිල පාලක.

## පළමුවෙනි උපලේඛනය

| | |
|---|---|
| හිස රහිත තෝර | හිස රහිත පරව් |
| හිස සහිත තෝර | හිස සහිත පරව් |
| හිස රහිත කට්ටා | කුම්බලාවෝ |
| කට්ටා සම්පූර්ණයෙන් | බොම්බිලි |
| හිස සහිත ලොකු අන්ජිලා | හිස රහිත කොඩුවා |
| හිස රහිත ලොකු අන්ජිලා | හිස සහිත කොඩුවා |
| හිස සහිත කුඩා අන්ජිලා | තොණ්ඩ |
| හිස රහිත කුඩා අන්ජිලා | බලයා |
| ලොකු හාල්මැස්සෝ | ලෙලි රහිත වියළි ඉස්සෝ |
| කුඩා හාල්මැස්සෝ | ලෙලි සහිත වියළි ඉස්සෝ |

## දෙවෙනි උපලේඛනය

| 1 වැනි තීරුව<br>පෙදෙස | 2 වැනි තීරුව<br>කොළඹ නාගරිකයේ ශුඩ බර හොණ්ඩරයකට අය කෙරිය යුතු වැඩිම තොග මිලට එකතු කළ යුතු මුදල<br>රු. ශ. | 3 වැනි තීරුව<br>කොළඹ නාගරිකයේ ශුඩ බර රාත්තලකට අය කෙරිය යුතු වැඩිම සිල්ලර මිලට එකතු කළ යුතු මුදල<br>රු. ශ. |
|---|---|---|
| (1) මහනුවර නාගරිකය, ගඟවට කෝරළය සහ උඩුනුවර යටිනුවර ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... ... ... ... | 4 0 | 0 5 |
| (2) පාතහේවාහැට, පාතදුම්බර, හාරිස්පත්තුව, තුම්පනේ සහ උඩපලාත ප්‍රාදේශීය ආදයම් නිලධාරිගේ කොට්ඨාශ ... ... ... ... | 4 20 | 0 5 |
| (3) (අ) උඩදුම්බර හා උඩ බුලත්ගම ප්‍රාදේශීය ආදයම් නිලධාරිගේ කොට්ඨාශය ...<br>(ආ) නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය | 4 50 | 0 6 |

**සැළකිය යුත්තක්.**—මේ මිල ගණන් ඉහතකි ද්‍රව්‍යයන් විකිණීමේ නියමිත මිල නොවේ. ඒවා ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි ඉතාම වැඩි මිල ගණන්ය. මේ මිල ගණන් වලට වඩා වැඩියෙන් ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය යුතු නොවේ.

---

**කේ.ඩී. 69 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය.**

**අතිරේක ආහාර ද්‍රව්‍යයෝ (අර්තාපල්)**

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ නියෝජ්‍ය ආහාර මිල පාලක තැන්පත් ඇලන් බැසිල් සැමුවෙල් නේසරාජා පුල්ලෙනායගම් වන මම, 1950 හේ අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි වගන්තියත් සමඟ කියවෙන 3 (2) වගන්තියෙන් මට පැවරී ඇති බල තල අනුව—

(1) අංක 11,350 සහ 1958 ජුනි 7 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක කේ. ඩී. 65 සහ 1958 ජුනි 5 වෙනි දින දරණ ආහාර මිල නියෝගයේ අර්තාපල්වල තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිලද සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිලද නියම කර ඇති කොටස් මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) 1950හේ 29 වෙනි අංකය දරණ මිල පාලන පනත අනුව සකස්වුණු, කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දකුට තොග වශයෙන් විකිණීමේදී ශුඩ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුධ බර රාත්තලක්ද, විකිණිය හැකි වැඩිම තොග සහ සිල්ලර මිල ගණන් වලට මෙයට යාකළ උපලේඛනයේ දෙවෙනි හා තුන්වෙනි තීරුවල සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ 1 වෙනි තීරුවේ පෙදෙස්වල අර්තාපල් විකිණිය හැකි වැඩිම තොග මිල සහ සිල්ලර මිල ගණන් ගත යුතු බැව් මෙයින් වහාම නියෝග කරමි.

(3) තුවද මෙම නියෝගයේ කාර්‍ය්‍යය සඳහා—

(අ) අර්තාපල් ශුඩ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් බවත්,

(ආ) අර්තාපල් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හොණ්ඩරයකට වඩා අඩු ප්‍රමාණයක් විකුණනු ලබන්නේ නම් එය සිල්ලරට විකිණීමක් බවත්, මෙයින් නියෝග කරමි.

(4) එසේම, උපලේඛනයේ සඳහන් සෑම පෙදෙසකම අර්තාපල් තුවත් දෙයක් සමග කලවම් කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බැව් නියෝග කරමි.

(5) එසේම, උපලේඛනයෙහි සඳහන් පෙදෙස්වල යම් තැනෙක හෝ යම් වාහනයක අර්තාපල් හිමිවීමක් හෝ පාලනයක් යටතේ තබාගන සිටින සෑම වෙළෙන්දකුම අර්තාපල්වල මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල ගණන් ප්‍රදර්ශනය කෙරෙන නිවේදනයක් එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ හොඳින් පෙනෙන පරිදි තැබිය යුතු බැව් මෙයින් නියම කරමි.

(6) එසේම, උපලේඛනයේ සඳහන් පෙදෙස්වල අර්තාපල් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ විකුණන සෑම කෙනෙකු විසින්ම මිලදී ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් දෑ ඇතුළු රිසිට් පතක් දිය යුතු බැව් නියෝග කරමි :—

(අ) විකුණූ දිනය,

(ආ) එම ද්‍රව්‍යය විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල,

(ඇ) වෙළෙඳම කුමක්ද යන බව, තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන බව.

(7) එසේම, මේ නියෝගයේ කාර්‍ය්‍ය සඳහා රාත්තල යන්නෙන් සලකනු ලබන්නේ "ඇවොර්දුපොයි" බර ක්‍රමය අනුව ගණන් ගත් රාත්තල බවද නියම කරමි.

(8) අර්තාපල් යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, නැතහොත් බහා ලනු ලැබේ නම් එහි මිලද මෙම මිල නියෝගයෙහි සඳහන් විකිණිය හැකි වැඩිම මිලට ඇතුලත් කොට තිබෙන බැව් නියම කරමි.

(9) ඕලන්දයෙන් ලැලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහයක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිල ගණන් ගත යුතු බවද,

(10) චීනයෙන් ලැලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් දහතුනක් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිල ගණන් ගත යුතු බවද,

(11) ජපානයෙන් ලැලි පෙට්ටිවල ගෙන්වන ලද අර්තාපල් විකුණන විට දළ බරින් තාර බර වශයෙන් පෙට්ටියකට රාත්තල් විසිපහක් අඩු කොට ඉතිරි බර අනුව විකුණන් මිල ගණන් ගත යුතු බවද,

(12) ලැලි පෙට්ටිවල හැර වෙන යම් කිසිවක බහා අර්තාපල් විකුණන විට අර්තාපල් ඇති එම එක එක භාණ්ඩය සඳහා රාත්තල් තුන බැගින් අඩුකොට ඉතිරි බර අනුව මිල ගණන් ගත යුතු බවද,

(13) මෙම නියෝගය සඳහා "ශුඩ" යන්නෙන් හැඟ වෙන්නේ දළ බරින් තාර බර අඩුකොට ඉතිරි වන බර හෝ අර්තාපල් වල පමණක් බර බවද නියම කරමි.

1959 යේ පෙබරවාරි මස 9 වැනි දින පස්වරු 2.45 මහනුවරදී අත්සන් කරන ලදී.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩ හේවාහැට කොට්ඨාශයේ
නියෝජ්‍ය ආහාර මිල පාලක.

## උපලේඛනය

| 1 වෙනි තීරුව | 2 වෙනි තීරුව | 3 වෙනි තීරුව |
|---|---|---|
| පෙදෙස | කොළඹ නාගරිකයේ ශුඩ බර හොණ්ඩරයකට අයකෙරිය යුතු වැඩිම තොග මිලට එකතු කළ යුතු මුදල | කොළඹ නාගරිකයේ ශුඩ බර රාත්තලකට අයකෙරිය යුතු වැඩිම සිල්ලර මිලට එකතු කළ යුතු මුදල |
| | රු. ශ. | රු. ශ. |
| (1) මහනුවර නාගරිකය, ගඟවට කෝරළය සහ උඩුනුවර යටිනුවර ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... | 4 0 | 0 5 |
| (2) පාතහේවාහැට, පාතදුම්බර, හාරිස්පත්තුව, තුම්පනේ සහ උඩපලාත ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ කොට්ඨාශය ... | 4 20 | 0 5 |
| (3) (අ) උඩදුම්බර හා උඩබුලත්ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය ... (ආ) නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය ... | 4 50 | 0 6 |

---

**කේ. ඩී. 70වෙනි අංකය දරණ ආහාර මිල නියෝගය.** **සහල්—තොග සහ සිල්ලර.**

### 1950හේ අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවර එළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ නියෝජ්‍ය ආහාර මිල පාලක තැන්පත්, ඇලන් බැසිල් සැමුවෙල් තේසරාජා පුල්ලෙනායගම් වන මම, 1950හේ අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි වගන්තියත් සමග කියැවෙන 3 (2) වෙනි වගන්තියෙන් නියෝජ්‍ය ආහාර හා මිල පාලක තැනට පැවරී ඇති බලතල අනුව—

(1) අංක 11,345 හා 1958වේ ජූනි මස 6 වෙනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශයේ සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් නියමිත අංක කේ. ඩී. 64 සහ 1958වේ ජූනි මස 2 වෙනි දින දරණ ආහාර මිළ නියෝගය 1959යේ පෙබරවාරි මස 9 වෙනි දින සිට අවලංගු කරමි.

(2) 1959යේ පෙබරවාරි මස 9 වෙනි දින සිට මීට යාකොට ඇති පළමුවෙනි උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් පෙදෙස්වල එම උප ලේඛනයේ දෙවන තීරයේ විශේෂිත මිළ ගණන්, සුද්ධ බරෙන් සහල් හොණ්ඩරයක් විකිණිය යුතු වැඩිම තොග මිල ගණන්වන අතර ඒ මිළ ගණන්වලට වඩා වැඩියෙන් තොග වශයෙන් සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(3) 1959යේ පෙබරවාරි මස 9 වෙනි දින සිට මීට යාකොට ඇති දෙවෙනි උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් පෙදෙස්වල එම් උප ලේඛනයේ දෙවන තීරයේ විශේෂිත මිළ ගණන් සුද්ධ බරෙන් සහල් රාත්තලක් විකිණිය යුතු වැඩිම සිල්ලර මිළ ගණන් වන අතර ඒ මිළ ගණන් වලට වඩා වැඩියෙන් සිල්ලර වශයෙන් සහල් නොවිකිණිය යුතු බැව් මෙයින් නියෝග කරමි.

(4) තවද, මෙම නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා—

(අ) මොනම සහල් ප්‍රමාණයක් වුවත් යලිත් විකිණීම සඳහා විකිණීමක් වුවහොත් ඒ විකිණීම තොග වශයෙන් විකිණීමක් බැව් ගණන් ගත යුතු බවත්,

(ආ) මොනම සහල් ප්‍රමාණයක් වුවත් පාරිභෝගය සඳහා හෝ පාවිච්චිය සඳහා විකිණීමක් වුවහොත් එම විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් බව ගණන් ගත යුතු බවත්, සහ

(ඇ) තොග වශයෙන් විකුණන සුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම සහල් ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩි ම මුදල ගණන් ගණු ලබන්නේ මෙහි සඳහන් සුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිල අනුව බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(ඈ) '' රාත්තල් '' හෙවත් '' රා '' යන්නෙන් සළකණු ලබන්නේ ඇවර්තුපෝයි බර ක්‍රමය අනුව සම්මත රාත්තල් බර බවද, නියම කරමි.

(5) එසේම, මෙම නියෝගයෙහි සඳහන් සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බලපවත්නා සෑම පෙදෙසකම වෙන ද්‍රව්‍යයකට කලවම් කොට බාල කොට කිසිවෙක් සහල් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයේ සඳහන් සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බල පවත්නා සෑම පෙදෙසෙකම යම් තැනෙක හෝ වාහනයක් තුළ හිමිවීමක් හෝ පාලනයක් යටතේ සහල් තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එම පෙදෙසේ සහල් විකිණිය යුතු වැඩිම මිළ ගණන් දක්වන නිවේදනයක් එකී ස්ථානයේ හෝ වාහනයේ හොඳින් පෙනෙන සේ ප්‍රදර්ශනය කර තැබිය යුතු බැව් නියම කරමි.

(7) එසේම, මේ නියෝගයේ සඳහන් සහල් විකිණිය හැකි වැඩි ම මිළ ගණන් බලපවත්නා සෑම පෙදෙසෙකම තොග වශයෙන් සහල් විකුණන සෑම කෙනෙකුම සහල් මිලදී ගන්නාට රිසිට් පතක් දිය යුතු බව සහ සිල්ලර වශයෙන් සහල් විකුණන සෑම කෙනෙකුම සහල් මිළදී ගන්නා ඉල්ලුවහොත්, ඔහුට රිසිට් පතක් දිය යුතු බව මෙයින් නියෝග කරමි. එම රිසිට් පතෙහි පහත සඳහන් දෑ අඩංගු විය යුතුය:—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ ප්‍රමාණය ;

(ඇ) විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාම කුමක්ද යන බව, එනම් තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන බව.

(8) එසේම, සහල් විකුණන විට සහල් ඔතන දෙයෙහි නැතහොත් බහා ලන දෙයෙහි මිළ ද මෙම නියෝගයෙහි නියම කරන ලද විකිණිය හැකි වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බැව් මෙයින් නියෝග කරමි.

අත්සන්කළේ : 1959යේ පෙබරවාරි මස 10 වෙනි දින පස්වරු 3.20 ට ය.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශයේ නියෝජ්‍ය ආහාර මිල පාලක.

## පළමුවෙනි උපලේඛනය

| 1 වෙනි තීරුව<br>පෙදෙස | 2 වෙනි තීරුව<br>සුද්ධ කිරුමින් හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. | ශ. |
|---|---|---|
| **'' අ '' මහනුවර දිස්ත්‍රික්කය** | | |
| (1) මහනුවර නාගරිකය සහ ගඟවට කෝරළය ... | 19 | 47 |
| **උඩුනුවර සහ යටිනුවර** | | |
| (2) කටුලියැද්ද ... ... ... | 19 | 48 |
| (3) ගෙලිඔය ... ... ... | 19 | 57 |
| (4) පිටුනුගම, දන්තුරේ, මැණික්දිවෙල සහ දවුලාගල ... | 19 | 61 |
| (5) වේදිරිප සහ මුරුතලාව ... ... | 19 | 59 |
| (6) වට්ටප්පොල ... ... ... | 19 | 71 |
| (7) කඩුගන්නාව ... ... ... | 19 | 48 |
| (8) ඊරියගම, පේරාදෙණිය ... ... | 19 | 49 |
| (9) බත්ගොඩපිටිය ... ... ... | 19 | 66 |
| (10) පොත්තෙපිටිය ... ... ... | 16 | 61 |
| (11) අලකොලාහ ... ... ... | 19 | 53 |
| **තුම්පනේ** | | |
| (12) ගලගෙදර ... ... ... | 19 | 84 |
| (13) හතරලියැද්ද ... ... ... | 19 | 67 |
| **හාරිස්පත්තුව** | | |
| (14) අරඹේකඩේ, පූජාපිටිය, සහ කුරුගොඩ ... | 19 | 71 |
| (15) හැදෙණිය, කුළුගම්මන, විගිහුම්පොල, අකුරණ සහ වැරැල්ලගම ... ... ... | 19 | 66 |
| (16) බරිගම ... ... ... | 19 | 61 |
| (17) යටිවැවල ... ... ... | 19 | 57 |
| (18) වෙලේකඩේ ... ... ... | 19 | 61 |
| (19) පලිපාන ... ... ... | 19 | 81 |
| (20) අලවතුගොඩ ... ... ... | 19 | 79 |
| (21) ගල්හින්න, අංකුඹුර ... ... | 20 | 10 |
| **පාත දුම්බර** | | |
| (22) වත්තේගම ... ... ... | 19 | 61 |
| (23) තෙල්දෙණිය ... ... ... | 19 | 91 |
| (24) පන්විල ... ... ... | 19 | 83 |
| (25) මඩවල ... ... ... | 19 | 70 |
| (26) නවයාලතැන්න, කටුගස්තොට ... ... | 19 | 49 |
| (27) පරණගම ... ... ... | 19 | 89 |
| (28) හුළු ගඟ ... ... ... | 20 | 5 |
| (29) කෙන්ගල්ල ... ... ... | 19 | 96 |
| (30) දිගන ... ... ... | 19 | 87 |
| (31) අඹතැන්න ... ... ... | 19 | 57 |
| (32) මැණික්හින්න ... ... ... | 19 | 80 |
| **උඩ දුම්බර** | | |
| (33) උඩිස්පත්තුව ... ... ... | 19 | 92 |
| (34) ඌරුගල ... ... ... | 20 | 6 |
| (35) හුන්නස්ගිරිය ... ... ... | 20 | 19 |
| (36) මොරගහමුල ... ... ... | 20 | 3 |
| **පාතහේවාහැට** | | |
| (37) මාරස්සන ... ... ... | 20 | 1 |
| (38) පට්ටියගම වෙළඳපොල ... ... | 20 | 13 |
| (39) තලාතුඔය ... ... ... | 19 | 80 |
| (40) ගලහ ... ... ... | 19 | 96 |
| (41) අම්පිටිය ... ... ... | 19 | 75 |
| **උඩ පලාත** | | |
| (42) ගම්පොල ... ... ... | 19 | 44 |
| (43) උළපනේ ... ... ... | 19 | 68 |
| (44) පුස්සැල්ලාව ... ... ... | 19 | 92 |
| (45) උඩුවෙල ... ... ... | 20 | 23 |
| (46) කලුගමුව ... ... ... | 19 | 75 |
| (47) මුල්ගම ... ... ... | 20 | 10 |

## පළමුවෙනි උපලේඛනය

| 1 වෙනි තීරුව<br>පෙදෙස | 2 වෙනි තීරුව<br>සුඩ කිරුමින් හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| **(අ) මහනුවර දිස්ත්‍රික්කය** | |
| **උඩ බුලත් ගම** | |
| (48) නාවලපිටිය ... ... ... | 19 70 |
| (49) හැටන් ... ... ... | 19 87 |
| (50) නෝවුඩ් ... ... ... | 20 8 |
| (51) බගවන්තලාව ... ... ... | 20 43 |
| (52) ගිණිගත්හේන ... ... ... | 20 17 |
| (53) මස්කෙළිය, අක්කරවත්ත, නෝටන් බ්‍රිජ්,හාර්නිශ් ... | 20 41 |
| **(ආ) නුවර එළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශය** | |
| (54) පදියපැලැල්ල ... ... ... | 20 27 |
| (55) මතුරට ... ... ... | 20 55 |
| (56) මානකොළ ... ... ... | 20 27 |
| (57) රිකිල්ලගස්කඩ ... ... ... | 20 17 |
| (58) රහතුන්ගොඩ ... ... ... | 20 24 |
| (59) හඟුරන්කෙත ... ... ... | 20 6 |
| (60) මුදුනපිට ... ... ... | 20 27 |
| (61) කරල්ලියැද්ද ... ... ... | 20 38 |

## දෙවෙනි උපලේඛනය

| 1 වෙනි තීරුව<br>පෙදෙස | 2 වෙනි තීරුව<br>සහල් රාත්තලක් සිල්ලරට විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| **(අ) මහනුවර දිස්ත්‍රික්කය** | |
| (1) මහනුවර නාගරික හා ගහවට කෝරළය ... | 0 18 |
| **උඩුනුවර සහ යටිනුවර** | |
| (2) කඹුරාදෙනිය, කැලියල්පිටිය, කුරුකුත්තල ... | 0 18½ |
| (3) ආඩියතැන්න වත්ත ... ... | 0 18½ |
| (4) උඩුනුවර, යටිනුවර කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 0 18 |
| **තුම්පනේ** | |
| (5) ගලගෙදරමඩිහේ, ගලගෙදර ... ... | 0 18 |
| (6) වැත්තෑව, මිණිගමුව, කුරගම, හද්දපිටිය, පොල්වත්ත, කනක්කරපොළ, වැලිගොඩපොල, අවුල්බෝදල, අලගල්ල, පට්ටපොල, දෙහිදෙණිය, මඩිගේ, දෙහිදෙණිය, පැලැන, රන්ගමුව, ගුණදහ, උඩුව, ගල්දෙල ... ... ... | 0 18½ |
| (7) තුම්පනේ කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 0 18½ |
| **හාරිස්පත්තුව** | |
| (8) නයංගොඩ, බෙරගම, වල්ගම, මැදවල, මරවානාගොඩ, කුරුඳුගොල්ල, බරිගම, වැරැල්ලගම, කුළුගම්මන, යටිවැවල, කොණ්ඩදෙනිය, කහවත්ත, පලිපාන, මුල්ලෙගම, අකුරණ, කුරුගොඩ, කුඹුරේගම, උගුරැස්සපිටිය, අලගොඩ, මාවතපොල, දෙරනෑගම, හපුගොඩ, බුලුකොහොතැන්න, ඕවිය, බටුගොඩ, ජීවානවත්ත, බෝතොට ... ... | 0 18 |
| (9) හාරිස්පත්තුව කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 0 18½ |
| **පාත දුම්බර** | |
| (10) වත්තේගම, යටිරාවණ, පල්ලේගම, මැණික්හින්න, නවයාලතැන්න, පන්විල, පිටියෙගෙදර මඩවල, මඩිගේ, නාපාන ... ... | 0 18 |
| (11) උඩුරාවණ, යටවර හුරිකඩුව, කුණ්ඩසාලේ, මහවත්ත, මඩොල්කැලේ, වළල, මීගම්මන, හුරිකඩුව මඩිහේ, අත්තරගල්ල, පල්ලේගම, අත්තරගල්ල උඩගම, අරත්තන උඩගම, අරත්තන පල්ලෙගම, පල්ලෙගම, වීළවල, ගුන්නැපාන, දෙරගමුව, තෙල්දෙණිය නගරය, තෙල්දෙණිය ගම, වැවේගම, කරලියද්ද, කුඹුක්කඳුර, රඹුක්වැල්ල, අමුණුගම, සිරිමල්වත්ත, හුලුගහ, බැද්දේගම, කෙන්ගල්ල ... | 0 18½ |
| (12.) නත්තරන්පොත, නාරන්පනාව, දඹරාව, උඩුගොඩ, ගිද්දව, ගොමගොඩ, ගෝනවල, කුඹල්ලොලුව ... | 0 18½ |
| (13) වෛරපිටිය, කොස්ගම, වටපාන, මහුසා, ගල්බොඩ වත්ත ... ... | 0 19 |
| (14) වේඩරුව ... ... ... | 0 19½ |
| (15) පාතදුම්බර කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 0 19 |



| 1 වෙනි තීරුව<br>පෙදෙස | 2 වෙනි තීරුව<br>සහල් රාත්තලක් සිල්ලරට විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| **උඩ දුම්බර** | |
| (16) උඩිස්පත්තුව, නගරය, ගබ්බල පල්ලබාගේ, ගබ්බල උඩබාගේ, පොද්දල්ගොඩ, බෝමුරේ, වටුලියැද්ද, නුගතැන්න ... ... .... | 0 18½ |
| (17) අම්බාලේ, දුණුවිල, ගංගොඩ, හාලිඇල, තලගුණ මහවෙල, උඩවෙල, පල්ලෙවෙල ... | 0 18½ |
| (18) වේරගම ... ... ... | 0 19 |
| (19) මීමුරේ වසම ... ... ... | 0 20½ |
| (20) උඩත්තාව, මඩුගල්ල ... ... | 0 19½ |
| (21) උඩදුම්බර කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 0 19 |
| **පාතහේවාහැට** | |
| (22) නෙහිනිවල ... ... ... | 0 18½ |
| (23) අම්පිටිය, පල්ලේගම, හිප්පොල, කොස්හින්න, කෙටවල, අම්පිටිය උඩගම ... ... | 0 18 |
| (24) ගලහ, දෙල්තොට, නුගලියැද්ද, බූටාවත්ත, ගොඩමුන්න, හපුතලේ පල්ලේගම, හපුතලේ උඩගම, දූල්මුරේ, කපුලියැද්ද, ගුරුදෙණිය, තැන්නෙකුඹුරු මාරස්සන, කන්දෙවෙල ... ... | 0 18½ |
| (25) පට්ටියගම, උඩපිටිය, වනහපුව, මහමැදගම උඩුවෙල | 0 19 |
| (26) බෝපිටිය, කලව්ටතැන්න ... ... | 0 19 |
| (27) ඇතුල්ගම, හේවාවිස්ස ... ... | 0 19½ |
| (28) පාතහේවාහැට කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 0 18½ |
| **උඩපලාත** | |
| (29) ගම්පොල, උළපොනේ, අටබාගේ, පල්ලෙගම, ගල්අට, බෝවල, නාරන්විට, කිරින්ද, වල්ලහගොඩ, දෙල් පිටිය, ඉහුරුවත්ත, අටබාගේ—වෙළඳපොල, ගම් පොළවෙල, රත්මල්කඩුව, අන්ගම්මන කහටපිටිය, කුඩමකේ, හේරුකෙල, මාවතුර, ලැගුන්දෙණිය, ගිරඋල්ල, පුපුරැස්ස, යටපාන, පල්ලෙපිටිය, පන් විලතැන්න කලුගමුව, උඩහේන්තැන්න ... | 0 18 |
| (30) අටබාගේ ඉහළගම ... ... | 0 19½ |
| (31) අටබාගේ උඩගම ... ... ... | 0 18½ |
| (32) දුණුකේවිල ... ... ... | 0 19 |
| (33) දෙළුව, අලුගොල්ල, හිඳගල, මියනගොල්ල, පුස්සැල් ලාව, පටිතලාව ... ... | 0 18½ |
| (34) උඩුවෙල ... ... ... | 0 19 |
| (35) උඩපළාත කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 0 18½ |
| (36) උඩබුලත්ගම, නාවලපිටිය, පැණිතුඩුව, පැණිතුඩුමුල්ල, මාම්පිටිය, කරහඳුන්ගල, බව්වාගම ... | 0 18 |
| (37) රඹුක්පිටිය, පල්ලෙගම, කඩියන්ලෙන, දෙකිඳ, නෝර්වුඩ්, හැටන්-දික්ඔය, රොසැල්ල, කාfපැක්ස්, fපෘටිහිල්, වැලිගම්පොල ... ... | 0 18½ |
| 38) ගිණිගත්හේන, කඩවල, මස්කෙළිය, නෝටන් බ්‍රිජ්, හානිෂ්-වටවල, අඹගමුව, උතුරු යටිගන්හුලහ, දකුණු යටිගන්හුලහ, කලුගල, පොල්පිටිය, හෝමාගම ... ... ... | 0 18½ |
| (39) අක්කරවත්ත ... ... ... | 0 19 |
| (40) කින්ටයර් වෙළඳපොල—කින්ටයර් ගම ... | 0 19 |
| (41) තියන්සින් ... ... ... | 0 19 |
| (42) අප්කොට් කිරිවන්එළිය, පතන කැලවැල්දෙණිය, බගවන්තලාව ... ... ... | 0 19 |
| (43) හහරාපිටිය ... ... ... | 0 20½ |
| (44) උඩබුලත්ගම කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 0 19½ |
| **(ආ) නුවරඑළි දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කොට්ඨාශය** | |
| (45) රිකිල්ලගස්කඩ, හඟුරන්කෙත, මාඔය, මාදන්වල ... | 0 18½ |
| (46) පදියපැලැල්ල, කහටදණ්ඩ, අලපලාතැන්න, ඉඩම් පිටිය, යටිවැවල, මුන්වත්ත, උඩපදියපැලැල්ල, වැල්ලගිරිය, මැටිබෙඹිය, මානකොළ, තුම්පැලහපුව, දෙනිකේ ගලුකේ, විල්වල, එල්ගම, දෙහිපේ පොර මඩුල්ල, ඇකිරිය, හපුගස්දෙණිය, වලුගම, දෙඩම් කුඹුරු, කවුගස්හින්න, උනන්තැන්න, මුදුනපිට, ගලඋඩ, උඩගම, කරලියැද්ද, ඉඩමේලන්ද, බට ගොල්ල, රහතුන්ගොඩ ... ... | 0 19 |
| (47) ඇහැලගස්තැන්න, උණගොල්ල, උඩවෙල, මතුරට, ලුණුකේබැද්ද, කොටයාපතන, ඉල්ලගොල්ල, උඩවත්ත, බඹරාගම ... ... | 0 19 |
| (48) වටගේපොත ... ... ... | 0 19½ |
| (49) උඩහේවාහැට කොට්ඨාශයේ ඉතිරි පෙදෙස් ... | 0 19½ |

**සැලකිය යුතුයි.**—මේ මිල ගණන් සහල් විකිණිය යුතු නියම මිල ගණන් නොවේ. ඒ මිල ගණන් සහල් විකිණිය හැකි වැඩිම මිල ගණන් ය. ඒවාට වඩා වැඩි මිලට සහල් විකිණිය යුතු නොවේ.

**පී. එල්. 1/59 අංකය දරණ ආහාර මිළ නියෝගය.**

අතිරේක ආහාර ද්‍රව්‍ය
(උම්බලකඩ)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් චාර්ල්ස් අබේදීර වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතෙහි 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1958 ජූනි මස 21 දින, අංක 11,367 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1958 ජූනි මස 16 දින පී. එල්./4 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උප ලේඛනයේ 3 වැනි සහ 4 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළද, මෙම නියෝගයෙන් 1959 පෙබරවාරි මස 1 දින සිට අවළංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යය වන උම්බලකඩ තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, එම උප ලේඛනයේ 2 වැනි තීරයේ පිළිවෙලින් සඳහන් ප්‍රදේශ තුල විකිණිය හැකි වැඩිම මිළ 1959 පෙබරවාරි මස 1 දින සිට එම උප ලේඛනයේ 3 වැනි සහ 4 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන වැඩිම මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) උප ලේඛනයේ 1 තීරයේ සඳහන් උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) උප ලේඛනයේ 1 තීරයේ සඳහන් උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ඇ) උප ලේඛනයේ 1 තීරයේ සඳහන් උම්බලකඩ තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) මීට යාකර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ, ඉහළම මිළ ගණන් නියම කොට ඇති සෑම ප්‍රදේශයක් ඇතුලත වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද, ඉහළම මිළ ගණන් නියම කර ඇති සෑම ප්‍රදේශයක් ඇතුලත, යම් ස්ථානයක හෝ වාහනයක උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබා ගෙන සිටින සෑමවෙළෙන්දෙකුම මෙම නියෝගයේ නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා." යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපෝයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) එසේම, උප ලේඛනයේ 1 තීරයේ සඳහන් උම්බලකඩ, මෙම නියෝගයේ ඉහළම මිළ ගණන් දක්වා ඇති සෑම ප්‍රදේශයකම, තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා, සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යනවග, ඇතුලත් කුවිතාන්සියක් දිය යුතු බවද මෙයින් නියෝග කරමි.

(8) මීට යාකර ඇති උප ලේඛනයේ 1 තීරයේ සඳහන් උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වේනොත් එහි මිළත් උප ලේඛනයේ 3 තීරයේ සහ 4 වැනි තීරයේ සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුලත්වී ඇති බවද මෙයින් නියම කරමි.

1959 පෙබරවාරි මස 10 දින පෙරවරු 10.00 ට පොලොන්නරුවේ දිසාපති කාර්‍යාලයේදී අත්සන් තබන ලදී.

සී. අබේදීර,
සහකාර මිළ (ආහාර) පාලක තැන.
පාලන දිස්ත්‍රික්කය, පොලොන්නරුව.

### උප ලේඛනය

| 1 තීරය | 2 තීරය | 3 තීරය | 4 තීරය |
|---|---|---|---|
| විස්තර | කොට්ඨාශය | තොග වෙළෙන්දෙකු සිල්ලර වෙළෙන්දෙකුට ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ (සියළුම වර්ගවල) ... | සිංහල පත්තුව ... | 247 25 ... | 2 56 |
| | මැද පත්තුව ... | 248 20 ... | 2 56 |
| | එගොඩ පත්තුව ... | 251 0 ... | 2 60 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැකියි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී